" ඌව අභියෝගයෙන් අභිමානයට "
**ඌව පළාත් සභාව**
ஊவா மாகாண சபை
**UVA PROVINCIAL COUNCIL**
ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය
ஊவா மாகாண பிரதான செயலாளர் அலுவலகம்
OFFICE OF THE CHIEF SECRETARY, UVA PROVINCE
රජ වීදිය, බදුල්ල. தொகுதி-இராஜ வீதி, பதுளை King's Street, Badulla
" විශිෂ්ඨතම ජනතා හිතවාදී පරිපාලනයක් "

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } 4/P/DEV/1/1-MMIS | ඔබේ අංකය / உமது இல / Your No. } | දිනය / திகதி / Date } 2018/04/09 |

ක්‍රමසම්පාදන චක්‍රලේඛ අංක :- 01/2018

ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්,
ඌව පළාත් සභාවේ සභා ලේකම්,
ඌව පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
ඌව පළාත් සභාවේ සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ඌව පළාත් සභාවේ සියළුම ආයතන ප්‍රධානීන්.

**<u>2018 වර්ෂයේ මූලධන ප්‍රතිපාදන ඵලදායී ලෙස ආයෝජනය කිරීම.</u>**

ඌව පළාත් සභාවේ 2018 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුව ඌව පළාත් සභාව විසින් සම්මත කරනු ලදුව, ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට/ ආයතනයට 2018 වර්ෂයේ වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳ මේ වන විටත් ඔබ දැනුවත් කර ඇත.

එමෙන්ම, 2018 වර්ෂය සඳහා සකස් කරන ලද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සැලැස්ම මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය සහිතව මවිසින් අනුමත කර ඇති අතර, උපමාන පාදක ප්‍රදාන (CBG) සැලසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රථම මාගේ පූර්ව අනුමැතිය ලබා ගන්නා ලෙසද දන්වා ඇත.

පවතින සීමිත මූලධන ප්‍රතිපාදන වඩාත් කාර්යක්ෂමව ආයෝජනය කිරීම සඳහා, සැලසුම් කර ඇති සියළුම ප්‍රසම්පාදන කටයුතු 2018/06/30 දිනට ප්‍රථම සහ අනුමත ක්‍රියාත්මක සැලැස්මේ සියළුම ක්‍රියාකාරකම් 2018/11/30 දිනට ප්‍රථම නිම කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

මූලධන ප්‍රතිපාදන ආයෝජනයේදී නිමවුම් වලට (Output) වඩා ප්‍රතිඵල (Result) කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු අතර, අදාල ප්‍රතිඵල ළඟා කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා අභ්‍යන්තර වශයෙන් විධිමත් සුපරීක්ෂණ හා අධීක්ෂණ ක්‍රියාවලියක් පවත්වා ගැනීම සුදුසු වේ. මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මාගේ ප්‍රධානත්වයෙන් යුතුව කාලීන ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බවද කාරුණිකව දන්වා සිටිමි.

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 055-2222809 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) / பிரதி பிரதான செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Admin) } 055-2222203 | සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary } 055-2222899 | ෆැක්ස් / தொலைநகல் / Fax } 055-2231670 |
| ෆැක්ස් / தொலைநகல் / Fax } 055-2223977 | ගණකාධිකාරී / கணக்காளர் / Accountant } 055-2229425 | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer } 055-2229426 | පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephones } 055-2222804 055-2222810 055-2222818 055-2222712 |

වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ ඇතුලත් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) හා උපමාන පාදක ප්‍රදාන (CBG) යටතේ ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු මෙහෙයුම් හා කළමනාකරණ තොරතුරු පද්ධතියට (MMIS) ඇතුලත් කිරීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය මගින් සිදු කරනු ලබන අතර, කාර්ය සාධන තොරතුරු (මූල්‍ය හා භෞතික ප්‍රගතිය) අදාල ක්‍රියාත්මක ආයතන විසින් යාවත්කාලීන කළ යුතුය. කෙසේ වෙතත් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) හා උපමාන පාදක ප්‍රදාන (CBG) නොවන වෙනත් මූල්‍ය ප්‍රභවයක් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු මෙහෙයුම් හා කළමනාකරණ තොරතුරු පද්ධතියටඇතුලත් කිරීම හා කාර්ය සාධන තොරතුරු යාවත්කාලීන කිරීමේ වගකීම ක්‍රියාත්මක ආයතනය සතුවේ. කළමනාකරණ තීන්දු තීරණ ලබා ගැනීමේ ක්‍රියාවලිය තොරතුරු පද්ධතියේ පවතින තොරතුරු මත පදනම්වන බැවින් ඉහල මට්ටමේ නිරවද්‍යතාවයකින් යුතු තොරතුරු උක්ත පද්ධතිය වෙත ඇතුලත් කිරීම සඳහා නිලධාරියකු නම් කර එම රාජකාරිය අදාල නිලධාරියාගේ රාජකාරි ලැයිස්තුවට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. එම නිලධාරීන් සඳහා මෙහෙයුම් හා කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීමට කටයුතු සම්පාදනය කරනු ලබන අතර, තොරතුරු පද්ධතියේ පවතින තොරතුරු වල නිරවද්‍යභාවය තහවුරු කර ගැනීම සඳහා විධිමත් අධීක්ෂණ ක්‍රමවේදයක් ආයතන මට්ටමින් ස්ථාපිත කිරීම සුදුසු වේ.

නොවැලැක්විය හැකි හේතූන් මත ක්‍රියාත්මක සැලැස්මේ සංශෝධනයන් සිදු කිරීමට අවශ්‍ය වන්නේනම් 2018/08/20 දිනට පෙර මාගේ අනුමැතිය සඳහා යොමු කළ යුතුය. සියළුම ක්‍රියාකාරකම් සංශෝධනයන් මාගේ අනුමැතියට යොමු කිරීම සඳහා මේ සමග අමුණා ඇති DCSP/D&M/01 ආකෘති පත්‍රය භාවිතා කරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර, ආකෘතියේ මෘදු පිටපත ප්‍රධාන ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියෙන් www.cs.up.gov.lk භාගත කර ගැනීමට පහසුකම් සලසා ඇත.

ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය වෙත වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදන ඵලදායී ලෙස ආයෝජනය කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඌව පළාතේ සංවර්ධන කටයුතු සඳහා ඔබ දක්වන සහයෝගය අගයකොට සලකමි.

පී.බී.විජයරත්න

ඌව පළාතේ ප්‍රධාන ලේකම්